සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** # පෙරදිග සංගීතය - I **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයː |
|---|

සැ.යු. :-

- ප්‍රශ්න 40 ට ම පිළිතුරු සපයන්න.
- දී ඇති වරණ 4 අතරින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ( ① ② ③ ④ ) එම වරණයට හිමි අංකය ⊗ කින් ලකුණු කරන්න.

---

01. ශුද්ධ නිෂාදය විවාදී ව යෙදෙන රාගය වන්නේ,

(i) යමන් (ii) බිලාවල් (iii) කාෆි (iv) භූපාලි

02. රාත්‍රී දෙවන ප්‍රහරයේ දී ගැයෙන පංචමය වාදී රාගයකි

(i) යමන් (ii) භෛරවී (iii) කාෆි (iv) භූපාලි

03. නිර්දේශිත රාග අතරින් සම්පූර්ණ ජාති නොවන රාගයකි

(i) භූපාලි (ii) යමන් (iii) භෛරවී (iv) කාෆි

04. මේලයේ නාමයම රාගයේ නාමය කරගත් ජනක රාගයක් නොවන පිළිතුර වන්නේ,

(i) බිලාවල් (ii) යමන් (iii) භෛරවී (iv) කාෆි

05. ස රි රි ගු ග ම' ප ධු ධ නි නි යන ස්වර සියල්ල යොදාගත හැකි රාගය

(i) භෛරවී (ii) භූපාලි (iii) යමන් (iv) බිලාවල්

06. 'ම ග ම රි ස' මෙම ස්වර සංගතිය ඇතුළත් රාගය

(i) භෛරවී (ii) බිලාවල් (iii) යමන් (iv) භූපාලි

07. ''පාරමිතා බල පූරිත පූජිත.......'' ගීතය සඳහා තනුව නිර්මාණය කිරීමට ආශ්‍රය කරගත් රාගය

(i) බිලාවල් (ii) යමන් (iii) භෛරවී (iv) කාෆි

08. ''මනමත් කරවන දන මුළු දෙරණා.....''

(i) දසමත් සේ ගීයකි. (ii) දොළොස්මත් සේ ගීයකි.

(iii) සොළොස්මත් සේ ගීයකි. (iv) සූවිසිමත් සේ ගීයකි.

09. ඣප් තාලය (ජප් තාලය) මත නිර්මාණය වූ ගීය

(i) සැදෑ කළුවර කුර ගගා විත් (ii) රන් මලක් ලෙස දෙව් බඹුන්

(iii) දන්නෝ බුදුන්ගේ (iv) රන් වන් කරල් සැලෙයි

10. සරල ගීතයක මුල් කොටස

(i) Bit (ii) Verse (iii) Adlib (iv) Chorus



*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

11.

| | | | |
|---|---|---|---|
| ධ ගෙ න ති | ධා ධිං ධිං ධා | ධා තිං තිං ත | ධා ධා ධිං - |
| x | 2 | 0 | 3 |

ඉහත දැක්වෙන තාල ප්‍රස්තාරය සඳහා යොදාගෙන ඇති තාල සංඛ්‍යාව

(i) 01 කි. (ii) 02 කි. (iii) 03 කි. (iv) 04 කි.

12. එම තාල ප්‍රස්තාරය සඳහා දායක කර නොගත් තාලය

(i) දීප්චන්දි (ii) ත්‍රිතාලය (iii) කෙහෙර්වා (iv) ලාවණී

13. තබ්ලා වාදනයක ඇතුළත් නොවන අංගයකි

(i) ජලා (ii) ගත් (iii) පරන් (iv) රේලා

14. නාදයේ අඩු වැඩි බව නැතහොත් හඬේ සැර ධ්වනි විද්‍යාවේ හඳුන්වන්නේ,

(i) විපුලතාවය ලෙසිනි. (ii) තාරතාවය ලෙසිනි.

(iii) ධ්වනි ගුණය ලෙසිනි. (iv) සංඛ්‍යාතය ලෙසිනි.

15. කොළපත් වලින් තනන ලද වෙස්මුහුණු භාවිතා කරන රංග සම්ප්‍රදාය

(i) කෝලම් (ii) සොකරි (iii) නූර්ති (iv) නාඩගම්

16. 'වැම්ලියන්' නම් රොක් සංගීත කණ්ඩායමේ සේවය කළ නූතන සංගීතඥයා

(i) බොබ්මාලි (ii) යානි (iii) රහ්මාන් (iv) ෂූබර්ට්

17. සේ ගී වර්ගයට අයත් ගීත විශේෂ දෙකකි

(i) මෙහෙ ගී - බැති ගී (ii) සමාජයීය ගී - ප්‍රශස්ති ගී

(iii) හටන් ගී - ඇඳහිලි ගී (iv) වන්නම් - ප්‍රශස්ති

18. ෂ්‍යාහි (ස්‍යාහි) නම් වූ කොටස අයත් සංගීත භාණ්ඩය

(i) තබ්ලාව (ii) වයලීනය (iii) සිතාරය (iv) එස්රාජය

19. අළුවකින් වයන සංගීත භාණ්ඩ යුගලය

(i) සිතරය - එස්රාජය (ii) සිතාරය - මැන්ඩලීනය

(iii) වයලීනය - එස්රාජය (iv) වයලීනය - බටනලාව

20. ''මේරේ මන්කි ගංගා....'' යන හින්දි චිත්‍රපට ගීතයේ තනුව නිර්මාණයට ආශ්‍රය කරගත් රාගය

(i) යමන් (ii) භෛරවී (iii) බිලාවල් (iv) කාෆි

21. මට | මැ s ණිව | ගේ s ම ට | පි යා s ව | ගේ s | මෙම ගීතය ආරම්භ වන්නේ,

(i) ආඝාතයෙන් (ii) සමග්‍රහයෙන් (iii) අවග්‍රහයෙන් (iv) විෂමග්‍රහයෙන්

- අංක 22 සිට 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත වගුව ඇසුරෙන් සපයන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1. | පැල් ගී | | මේවර කෙළිය | |
| 2. | | | | |
| 3. | | දෙවොල්මඩු | | ප්‍රශස්ති ගී |

22. අනාඝාතාත්මක ගීත ඇතුලත් තීරුව කුමක් ද?

(i) A (ii) B (iii) C (iv) D

23. වන්නම් හා තුන් සරණේ ගීත ඇතුළත් කළයුතු තීරු 2 පිළිවෙලින්

(i) A - B (ii) B - D (iii) C - D (iv) D - B

24. A, B, C, D යන තීරුවල සඳහන් කරුණු පිළිවෙලින් නම් කළ යුත්තේ,

(i) මෙහෙ ගී, සමාජයීය ගී, ඇදහිලි ගී, සේ ගී (ii) මෙහෙ ගී, ඇදහිලි ගි, සමාජයීය ගී, සේ ගී

(iii) සේ ගී, ඇදහිලි ගී, සමාජයීය ගී, මෙහෙ ගී (iv) සමාජයීය ගී, මෙහෙ ගී, සේ ගී, ඇදහිලි ගී

25. අර්ධ ස්වරයක (Semitone) පරතරය ඇති ස්වර යුගලය තෝරන්න.

(i) ස, රි (ii) රි, <u>ග</u> (iii) ග, ම' (iv) ම ප

26. ''රස බොජුනක් නැතත් තුන් වේලට කන්ට'' යන ගීතය ඇතුළත් නාට්‍ය

(i) අන්දරේලා (ii) කුස පබාවතී (iii) රාජ කපුරු (iv) තටු

27. දෙසවන් බිහිරි වුවද සංධ්වනියක් නිර්මාණය කළ අපරදිග සංගීතඥයා

(i) බීතෝවන් (ii) මෝසාර්ට් (iii) යානි (iv) ෂූ බර්ට්

28. වයස අවුරුදු 9 දී සිය ප්‍රථම සිම්ෆනිය (Symphony) ඉදිරිපත් කළේ,

(i) මෝසාර්ට් (ii) බාක් (iii) යානි (iv) ෂූ බර්ට්

29. බෙර පදය, තානම, කවිය හා ඉරට්ටිය යන අංග සහිත වන්නම් සම්ප්‍රදාය

(i) උඩරට (ii) පහතරට (iii) සබරගමු (iv) නෛඅඩි වන්නම

30. පිය ගුණ වරුණ සඳහන් ගීතයකි

(i) අන්දර යායේ (ii) පාන් කිරිත්තා

(iii) ලෝනා මුණි රාජගේ (iv) සමන් වැලේ'මල් ජයට පිපීලා

31. නාඩගම් ගීතයක් වන ''ඒ බුදුබව පතමින් ලොබිනේ.....''

යන ගීතය පාදක කරගනිමින් නිර්මාණය වූ නව නෘත්‍ය ගීතය කුමක් ද?

(i) දස දෙස ඉන්ද්‍රා (ii) බුදු තුල් ගුණැති

(iii) මැ වේ මා දුටු කොමළ ලියා (iv) ලප නොමවන් සඳ

32. වෙස්සන්තර නාට්‍යයේ එන වැලපුම් ගී නාද රටා අනුසාරයෙන් නිර්මාණය වූ සරල ගීයකි

(i) දුනුකෙයියා මලක් වගේ (ii) ගමට කලින් හිරු

(iii) කඳුළු හෙලා නැඹිලියට (iv) මිහි මඩලේ අඳුරු කුසේ

33. විශාරද බී. වික්ටර් පෙරේරා (දේශීය), වී. ජී. ජෝග් (උත්තර භාරතීය) යන ශිල්පීන් ප්‍රවීණත්වයක් දරූ සංගීත භාණ්ඩය වන්නේ,

(i) වයලීනය (ii) බටනලාව (iii) එස්රාජය (iv) සිතාරය

34. රත් තං කිට දිත් තං යන බෙර පදය වාදනය කිරීමට සුදුසු ම අවනද්ධ භාණ්ඩය

(i) ගැටබෙරය (ii) දවුල (iii) මද්දලය (iv) යක්බෙරය

35. සඩ්ජය සඳහා වන සංඛ්‍යාතය 256Hg නම් පංචමයේ සංඛ්‍යාතය

(i) 284 Hz කි. (ii) 320 Hz කි. (iii) 340 Hz කි. (iv) 384 Hz කි.

36. දොහොරාවක් ද සහිතව රිද්ම රටා කිහිපයකට අනුව ගැයෙන චිත්‍රපට ගීතයකි

(i) සිනිඳු සුදු මුතු තලාවේ (ii) ගලන ගඟකි ජීවිතේ

(iii) කුල ගෙදරින් දුම්බර කඳුවැටියේ (iv) ජීවන මේ ගමන සංසාරේ

37. G Major scale (G මේජර් ස්කේලය) ට අනුව පෙරදිග ස්වර පෙළගස්වා ඇති පිළිතුරු වන්නේ,

(i) ප̣ ධ̣ නි̣ ස රි ග ම ප (ii) ප̣ ධ̣ නි̣ ස රි ග ම´ ප

(iii) ප̣ ධ̣ නි̣ ස රි <u>ග</u> ම ප (iv) ප̣ ධ̣ <u>නි̣</u> ස රි ග ම ප

38. රිපිටේෂන් (Repitation Mark) සංකේතයක් <u>නොවන්නේ</u>,

(i)  (ii)  (iii) % (iv) 

39. කැලිප්සෝ කණ්ඩායම් ගීතයකි

(i) ගලන ගලකි ජීවිතේ (ii) සරුංගලේ වරල් සැලේ

(iii) දෑඩිකළ මාතා (iv) මං ගෝ කළු නැන්දේ

40.  මෙම කී සිග්නේචරය (Key Signature) අයත් මේජර් ස්කේලය (Major Scale)

(i) G (ii) F (iii) D (iv) C

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය 2020
# පෙරදිග සංගීතය - II

11 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

**උපදෙස් :**
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) (i) ස රි ස , ස රි ග රි ස ......... භූපාලි රාගයට අනුව මෙහි මීළඟ පියවර ලියන්න.

(ii) ඍඩ්ජය සංවාදි වන රාත්‍රී කාලයේ ගැයීමට සුදුසු රාගයක් නම් කරන්න.

(iii) තාන තනා තන තනෙනා ලෙස තානම ආරම්භ වන වන්නම කුමක් ද?

(iv) ''සුවඳ සබන් ඇඟ ගාලා හායි හායි....'' ගීතය ඇතුළත් නාට්‍ය කුමක් ද?

(v) ප නි රි (G B D) මෙම ස්වර සංචය (Chord) එක නම් කරන්න.

(vi) පැස්ටෝරල් සිම්ෆනිය (Pastoral Symphony) නිර්මාණය කළ අපරදිග සංගීතඥයා නම් කරන්න.

(vii) අලගනායිදු නම් දකුණු ඉන්දියානු සංගීතඥයාගේ දායකත්වය ලද රංග ශෛලිය නම් කරන්න.

(viii) | <u>ධ</u> ම <u>ධ</u> <u>නි</u> | ස් - ස් ස් | ලෙස අන්තරා කොටස ආරම්භ වන ලක්ෂණ ගීතයෙන් කියැවෙන්නේ කුමන රාගයක් පිළිබඳව ද?

(ix) 'හෙළ ගී මග සහ 'ශ්‍රී ලංකාවේ සංගීත සම්භාවය' යන ග්‍රන්ථ රචනා කළ කතුවරු පිළිවෙලින් නම් කරන්න.

(x) පර්දා සහිත හා පර්දා රහිත අපරදිග තත් වාද්‍ය භාණ්ඩ 2 ක් නම් කරන්න.

(02) (i) විකෘති ස්වර <u>නොයෙදෙන</u> නිර්දේශිත රාගයක් තෝරාගෙන එම රාගය නම් කර එහි මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න.

(ii) ඒ සඳහා සුදුසු මාත්‍රා 8 කට <u>නො අඩු</u> තානාලංකාර 2 ක් සඳහන් කරන්න.

(iii) නිර්දේශිත ඖඩව ජාති රාගයේ පහත සඳහන් කරුණු සඳහන් කරන්න.

* මේලය
* ආරෝහණ, අවරෝහණ
* වාදී, සංවාදී ස්වර
* මුඛ්‍යාංගය

(03) විවාදි ස්වර ඇතුළත් නිර්දේශිත රාගයක පහත සඳහන් අංශ සඳහා පිළිතුරු සපයන්න.

(i) මධ්‍යලය හෝ සර්ගම් ගීතයක ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාරය සඳහන් කරන්න.

(ii) එම රාගයේ මේලය, ආරෝහණය, අවරෝහණය, වාදී, සංවාදි ස්වර, රාග ජාතිය, මුඛ්‍යාංගය හා ගායන සමය යනාදිය සඳහන් කරන්න.

(iii) එම රාගයේ යෙදෙන විවාදි ස්වර නම් කර, රාගයක යෙදෙන විවාදි ස්වර යනු මොනවාදැයි පැහැදිලි කරන්න.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(04) (i) ඔබ උගත් නූර්ති හෝ නව නාට්‍ය ගීතයක මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(ii) ඒ සඳහා යොදාගත් හින්දුස්ථානි තාලයේ ඨේකාව නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(iii) නූර්ති හා නාඩගම් යන රංග ශෛලීන්වල ඇතුළත් වූ සංගීතයේ විශේෂ ලක්ෂණ 3 බැගින් නම් කරන්න.

(05) (i) උඩරට වන්නම්, පහතරට වන්නම් හා සබරගමු වන්නම් යන වන්නම් සම්ප්‍රදායන්ගෙන් <u>එකක්</u> තෝරාගෙන පහත සඳහන් මාතෘකා සඳහා කෙටි විස්තර සපයන්න.

* වන්නම්වල ආරම්භය
* යොදාගත් අවනද්ධ භාණ්ඩ
* වන්නම් ගණන
* වන්නමක කොටස්

(ii) ඔබ උගත් ඕනෑම වන්නමක මුල් කවියේ පද සඳහන් කරන්න.

(iii) ගැමි ගී සහ සේ ගී වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 2 බැගින් සඳහන් කරන්න.

(06) (i) පහත සඳහන් මාතෘකා වලින් 2 ක් සඳහා විස්තර සපයන්න.

* කපිරිඤ්ඤ ගීත
* නාද නිෂ්පත්තිය හා ප්‍රගමනය
* ග්‍රැමෆෝන් තැටි ගී
* මුල් යුගයේ සරල ගී

(ii) රේඛාව චිත්‍රපටය හෝ සත්සමුදුර චිත්‍රපටය යන එක් සිනමාවක් පිළිබඳව පහත සඳහන් ශීර්ෂ සඳහා විස්තර සපයන්න.

* තිරගත වූ වර්ෂය
* සංගීත අධ්‍යක්ෂණය
* ජනප්‍රිය වූ ගීත
* ගායන ශිල්පී / ශිල්පිණියන්

(07) (i) පහත සඳහන් මාතෘකාවලින් <u>2 ක්</u> තෝරාගෙන විස්තර සපයන්න.

* සංගීත නිර්මාණ කටයුතු සඳහා පරිගණකයේ දායකත්වය
* ඒ. ආර්. රහ්මාන්ගේ ජීවන තොරතුරු හා සංගීත නිර්මාණ
* අමදියෙස් මොසාර්ට්ගේ ජීවන තොරතුරු හා සංගීත නිර්මාණ
* ලයනල් රංවල සහ සී. ද අස්. කුලතිලක යන දේශීය සංගීතවේදීන් ලාංකීය සංගීතයට කළ සේවය

(ii) තබ්ලාවේ මුහුණතේ දළ රූප සටහනක් ඇඳ ඒ මත උපදින තබ්ලා අක්ෂර 4 ක් ලකුණු කරන්න.

(iii) පහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පරිවර්තනය කරන්න.



**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2020**

**11 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (iii) | 2 - (iii) | 3 - ( i ) | 4 - ( ii ) | 5 - ( i ) | 6 - ( ii ) | 7 - (iii) | 8 - (iii ) | 9 - (iv) | 10 - (iv) |
| 11 - (iii) | 12 - (iv) | 13 - ( i ) | 14 - ( i ) | 15 - ( ii ) | 16 - ( ii ) | 17 - (iv) | 18 - ( i ) | 19 - (iii) | 20 - ( ii ) |
| 21 - (iv) | 22 - ( i ) | 23 - (iv) | 24 - ( ii ) | 25 - ( ii ) | 26 - ( i ) | 27 - ( i ) | 28 - ( i ) | 29 - ( ii ) | 30 - ( i ) |
| 31 - (iii) | 32 - (iii) | 33 - ( i ) | 34 - (iii) | 35 - (iv) | 36 - ( i ) | 37 - ( ii ) | 38 - (iv) | 39 - (iv) | 40 - ( i ) |

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

## II පත්‍රය

(01) (i) ස රි ග ප ග රි ස (ii) කාෆි (iii) කෝකිල වන්නම (iv) රාජ කපුරු
(v) G Major / G මේජර් (vi) බීතෝවන් (vii) නාඩගම් (viii) භෛරවී
(ix) ඩබ්. බී. මකුලොලුව සහ සී. ද එස්. කුලතිලක
(x) ගිටාර් / ඉංග්‍රීසි මැණ්ඩලීනය සහ වයලීනය / වියෝලා වැනි සංගීත භාණ්ඩ
(i සිට viii දක්වා ලකුණු 1 බැගිනි. / ix සිට x දක්වා ලකුණු 2 බැගිනි.) (ලකුණු 8 + 4 = 12)

(02) (i) බිලාවල් හෝ භූපාලි යන රාගවලින් එක් රාගයක අදාල ස්ථායි කොටස් නියමිත ස්වර සංඥා, තාල සංඥා සහිතව (ලකුණු 04)
(ii) තානාලංකාර 2 සඳහා (ලකුණු 04)
(iii) භූපාලි රාගයේ - මේලය (ලකුණු 01)
ආරෝහණ-අවරෝහණ (ලකුණු 01)
වාදී සංවාදී (ලකුණු 01)
මුඛ්‍යාංගය (ලකුණු 01) (මුළු ලකුණු 12)

(03) (i) කාෆි හෝ භෛරවී රාගයේ මධ්‍යලය හෝ සර්ගම් ගීතයේ ස්ථායි කොටස සඳහා (ලකුණු 04)
(ii) එම රාගයේ රාග විස්තරයට (ලකුණු ½ x 8 = 04)
(iii) * විවාදි ස්වර නම් කිරීමට (ලකුණු 02)
* විවාදි ස්වර යනු පැහැදිලි කිරීමට (ලකුණු 02)
(මුළු ලකුණු 12)

(04) (i) නූර්ති ගීතයක හෝ නව නාට්‍ය ගීතයක මුල් කොටසේ ගීත පද සමග ස්වර ප්‍රස්තාරය සඳහා (ලකුණු 2 + 2 = 04)
(ii) අදාල හින්දුස්ථානි තාලයේ තාල ඡේකාව (නියමිත තාල, සංඥා, මාත්‍රා සංඛ්‍යා, විභාග යනාදිය ඇතුලත්ව) (ලකුණු 02)
(iii) නූර්ති හා නාඩගම් යන රංග ශෛලීන්වල දක්නට ලැබුණු සංගීතමය ලක්‍ෂණ 3 බැගින් වූ පිළිතුර සඳහා (ලකුණු 3 x 2 = 06)
(මුළු ලකුණු 12)

(05) (i) වන්නම් සම්ප්‍රදායයන්ගෙන් එකක අදාල කරුණු 4 කෙටියෙන් විස්තර කිරීම මඳහා (ලකුණු 2 x 4 = 08)
(ii) වන්නමක මුල් කවියේ පද නිවැරදිව සඳහන් කිරීම සඳහා (ලකුණු 02)
(iii) ගැමි ගී වල හා සෙ ගි වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 2 බැගින් සඳහන් කිරීම සඳහා (ලකුණු ½ x 4 = 02)
(මුළු ලකුණු 12)

(06) (i) මාතෘකා 2 ක් පිළිබඳව විස්තර සැපයීම සඳහා
(හරවත් කරුණු 4 බැගින් සපයා තිබීම ප්‍රමාණවත් වේ.) (ලකුණු 4 x 2 = 08)
(ii) රේඛාව හෝ සත්සමුදුර යන චිත්‍රපට වලින් 1 ක් පිළිබඳව අදාල මාතෘකාවලට කරුණු සැපයීම සඳහා (ලකුණු 1 x 4 = 04)
(මුළු ලකුණු 12)

(07) (i) මාතෘකා 2 ක් පිළිබඳව හරවත් කරුණු 4 බැගින්වත් සපයා තිබිය යුතුයි. (ලකුණු 4 x 2 = 08)
(ii) දායාං හා බායං හි මුහුණත් ඇඳ ඒ මත අක්ෂර 4 නිවැරදිව ලකුණු කිරීම සඳහා (ලකුණු 02)
(iii) | + ධරි රිග | රි ස ධ - | - සධ පම | ම - ම - | ලෙස පරිවර්තනය කර තිබීම සඳහා (ලකුණු ½ x 4 = 02)
(මුළු ලකුණු 12)

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020
# පෙරදිග සංගීතය

11 ශ්‍රේණිය

## ප්‍රායෝගික පරීක්ෂණය

<table>
<tr><th></th><th>ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර</th><th>ලකුණු</th><th>A කොටස</th><th>B කොටස</th></tr>
<tr><td>01</td><td>(i) 'අ' කාරයෙන් ගයන ස්වර 4 නම් කරන්න.<br>(ii) ස්වර අභ්‍යාසයේ සතරවැනි පියවර ලියන්න.<br>(iii) ස්වර ඛණ්ඩය අයත් රාගය නම් කරන්න.<br>(iv) තාල ඨේකාව ප්‍රස්තාර කරන්න.<br>(v) 'අ' කාරයෙන් ගයන ගීතයට අදාල තොරතුරු සපයන්න.</td><td>20</td><td>ශ්‍රවණ පරීක්ෂණය</td><td>ශ්‍රවණ පරීක්ෂණය</td></tr>
<tr><td>02</td><td>කැමති රාගයක පහත දැක්වෙන කොටස් ඉදිරිපත් කරන්න.<br>* ආරෝහණ - අවරෝහණ<br>* ස්ථායි<br>* අන්තරා<br>* තාන 2 ක්<br>* ස්වර සංගතියක්</td><td>20</td><td>භෛරවී<br>බිලාවල්<br>කාෆි<br>භූපාලි<br>යමන්</td><td>භෛරවී<br>බිලාවල්<br>කාෆි<br>භූපාලි<br>යමන්</td></tr>
<tr><td rowspan="5">03</td><td rowspan="5">(i) තෝරාගත් රාගයක මධ්‍යලය ගීතයක/ලක්ෂණ ගීයක ස්ථායී කොටස ගයන්න/වයන්න.<br>(ii) ස්වර කොටස අනුකරණය කරන්න.<br>(iii) ස්වර අභ්‍යාසයක් උච්ච ස දක්වා ගයන්න/වයන්න.<br>(iv) තෝරාගත් ව්‍යවහාරික සංගීතාංගය ඉදිරිපත් කරන්න.<br>(v) රාගයක ආභාෂය ලත් සරල ගීය ගයන්න / වයන්න.</td><td rowspan="5">20</td><td>බිලාවල්, භූපාලි, කාෆි</td><td>බිලාවල්, භූපාලි, කාෆි</td></tr>
<tr><td>අදාල ස්වර සංගතිය</td><td>අදාල ස්වර සංගතිය</td></tr>
<tr><td>ශුද්ධ ස්වර අභ්‍යාසය</td><td>ශුද්ධ ස්වර අභ්‍යාසය</td></tr>
<tr><td colspan="2">රිද්ම රටාවක් වාදනය</td></tr>
<tr><td colspan="2">අතින් තාල නිරූපණය</td></tr>
<tr><td rowspan="5">04</td><td rowspan="5">(i) තෝරාගත් ජන ගීය ගයන්න/වයන්න.<br>(ii) තෝරාගත් අනාසාතාත්මක ජන ගීය ගයන්න / වයන්න.<br>(iii) ජන ගී ආශ්‍රිත සරල ගීය ගයන්න / වයන්න.<br>(iv) තෝරාගත් ව්‍යවහාරික සංගීතාංගය ඉදිරිපත් කරන්න.<br>(v) රාගයක ආභාෂය ලත් සරල ගීය ගයන්න / වයන්න.</td><td rowspan="5">20</td><td>තුන්සරණේ ගී<br>උඩරට වන්නමක්</td><td>මෙහෙ ගීයක්<br>සබරගමු වන්නමක්</td></tr>
<tr><td>පාරු ගීයක්<br>පතල් ගීයක්</td><td>පතල් ගීයක්<br>ගැල් ගීයක්</td></tr>
<tr><td colspan="2">ජන ගී ආශ්‍රිත සරල ගීයක්</td></tr>
<tr><td>නූර්ති ගීයක්<br>ග්‍රැමෆෝන් ගීයක්<br>ගීත නාටක ගී</td><td>නව නාට්‍ය ගී<br>සිංහල චිත්‍රපට ගී<br>මව්පිය ගුණ වරුණ ගී</td></tr>
<tr><td colspan="2">රාගාශ්‍රිත සරල ගීයක්</td></tr>
<tr><td>05</td><td>(i) ඉදිරියේ දැක්වෙන ගීයක් ස්වර වාද්‍ය භාණ්ඩයකින් වයන්න. නැතහොත් තබ්ලාවෙන් තාල ඨේකාවක් වාදනය කරන්න. (වාදකයින් ගැයිය යුතුවේ)<br>(ii) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් ඉදිරියේ දැක්වෙන ගීතයක් වාදනය කරන්න.</td><td>16</td><td colspan="2">ළමා ගී, නව නාට්‍ය, හින්දි චිත්‍රපට ග්‍රැමෆෝන් ගී, නූර්ති ගී, සිංහල චිත්‍රපට ගී, නාඩගම් ගී, සරල ගී, දේශාභිමානි ගී, ගීත නාටක ගී, මව්පියවරුණ ගී, බ්‍යාල් ගීත හෝ වාදිත</td></tr>
<tr><td></td><td>* සමස්ත ශිල්පීය ප්‍රාගුණ්‍යය හා ප්‍රාසාංගික බව ඇගයීම</td><td>04</td><td colspan="2"></td></tr>
<tr><td></td><td>මුළු ලකුණු</td><td>100</td><td colspan="2"></td></tr>
</table>

*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371






Online shopping
**www.lol.lk**
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## කෙටි සටහන් පොත්










මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්

# ගෙදරටම ගෙන්ව ගන්න

# ඔන්ලයින් ඔඩර් කරන්න

# WWW.LOL.LK

# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

